# ආහාර ආයුධ හා දැනුම නිෂ්පාදනය කරමු

ආණ්ඩුව කොටි සංවිධානය සමග එකතුවී ජිනීවා හි කරන ලද ඒකාබද්ධ ප්‍රකාශනයෙන් ඊනියා සටන් විරාම ගිවිසුම හෙවත් රනිල් ප්‍රභාකරන් ගිවිසුම සංශෝධනය වී යැයි කීමට ඇතැම්හු මහත් උත්සාහයක් ගත්හ. එහෙත් එය දැන් ව්‍යර්ථ වී ඇතැයි යනු අපේ විශ්වාසයයි. එහෙත් මේ කතාව නැවතුණේ රටේ මහජනතාවගේ විරුද්ධත්වයට කන්දීමක් වශයෙන් නොව ජපන් තානාපතිවරයාගේ අවවාදය හෙවත් තර්ජනය නිසා යැයි සිතිය හැකිය. අවවාදය හෙවත් තර්ජනය යනුවෙන් ලිවීම වැරැදි යැයි කිසිවකු කීමට ඉඩ ඇත. එහෙත් බටහිරයන් හා දැන් බටහිරයන්ම වැනි වූ ජපනුන් කටයුතු කරන්නේ එලෙසින්ය. ඔවුන් තර්ජනය කරන්නේ අප තර්ජනය කරන අයුරින් නොවෙයි. ඔවුන්ගේ තර්ජනයෙහි ඇත්තේ අවවාදාත්මක ස්වරූපයකි. ඔවුන්ට යමකු නරක යැයි කීමට අවශ්‍ය වූ විට ඔවුන් කියන්නේ ඒ පුද්ගලයා හොඳම පුද්ගලයා නොවන බවය. හොඳම පුද්ගලයා නොවේය යන්නෙන් අදහස් කරන්නේ ඊළඟට හොඳ පුද්ගලයා යැයි අපේ ඇතැම්හු සිතති. එහෙත් ඒ එසේ නොවෙයි. ඉංගිරිසි ක්‍රිකට් ක්‍රීඩා විචාරකයකු අහවලා හොඳම පන්දු රකින්නා නොවේ. (හී ඉස් නොට් ද බෙස්ට් ෆීල්ඩර්) යැයි කියන විට ඉන් අදහස් කරන්නේ අදාළ තැනැත්තා වැඩකට නැති පන්දු රකින්නකු බවය. ඉංගිරිසිකාරයෝ දිය යටින් ගිනිගෙන යෑමෙහි දක්ෂයෝ වෙති.

ජිනීවා සාකච්ඡා අවසානයේදී නිකුත් කළ ප්‍රකාශයෙන් රනිල් ප්‍රභාකරන් ගිවිසුම සංශෝධනය වී යැයි ආණ්ඩුව කියා සිටිය ද කොටි ඒ බවක් නොපිළිගත්හ. ගිවිසුමක් සංශෝධනය කිරීමට දෙපාර්ශ්වය එකඟවිය යුතු වෙයි. එලෙසම ගිවිසුමක් සංශෝධනය කිරීමට එකඟවීමම ගිවිසුම පිළිගැනීමකි. සංශෝධනය කළ හැක්කේ පිළිගත් ගිවිසුමකි. රනිල් ප්‍රභාකරන් ගිවිසුම පිළිගත යුත්තේ ඇයි? එය රනිල් වික්‍රමසිංහ මහතා හා වේලුපිල්ලේ ප්‍රභාකරන් අතර ඇතිවූ ගිවිසුමක් මිස ලංකාණ්ඩුව හා කොටි සංවිධානය අතර ඇතිවූ ගිවිසුමක් නොවෙයි. එවකට ජනාධිපතිනිය වූ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය එවැනි ගිවිසුමක් ගැන දැන ගත්තේ ගිවිසුම අත්සන් කිරීමෙන් පසුවය. මෙරට ජනාධිපති ත්‍රිවිධ හමුදාවේ ආඥාධිපති වෙයි. යුද්ධ ප්‍රකාශ කිරීම, යුද්ධ නැවැත්වීම ආදිය කළ හැක්කේ රටේ ජනාධිපතිටය. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුව අගමැතිට ඒ සම්බන්ධයෙන් කළ හැකි දෙයක් නැත. මෙරට සිවිල් හෝ වෙනත් ආකාරයක යුද්ධයක් ඇතැයි අපි නොපිළිගනිමු. අද ඇත්තේ කරුණාගේ පාර්ශ්වයත් පරාජය කිරීමට නොහැකි කොටි නමින් හැඳින්වෙන කැණහිළුන් පිරිසකගේ බෝම්බ පිපිරවීම් ආදී ත්‍රස්තවාදී ක්‍රියා කිහිපයක් පමණකි. ඒ කැණහිළුන් සමග රනිල් වික්‍රමසිංහ වැන්නකු ගිවිසුම් අත්සන් කළද, වගකිව යුතු අදීන ආණ්ඩුවක් ගිවිසුම් අත්සන් කළ යුතු නොවෙයි. එබැවින් රනිල් වික්‍රමසිංහ ගිවිසුම සංශෝධනය කිරීමේ හෝ අවශ්‍යතාවක් පැන නොනගියි. කළ යුතුව ඇත්තේ ඒ ගිවිසුම හොර ගිවිසුමක් සේ සලකා මුළුමනින්ම ප්‍රතික්ෂේප කිරීමය. ඒ සඳහා තවමත් ප්‍රමාද නැත.

ආණ්ඩුව හා කොටි රනිල් ප්‍රභාකරන් ගිවිසුම සංශෝධනය කිරීම ගැන විවිධ කතා කියමින් සිටියදී ජපන් තානාපතිවරයා කියා සිටියේ ඒ කතා වහාම අත්හරින ලෙසය. ඒ අණක් විය. අණ ඉටුනොකර අපට ඊනියා ආධාර එනම් ණය ලබාගත නොහැකිය. අප රටේ ආණ්ඩුවලට ණයෙන් තොර රටක් ගැන සිතිය නොහැකිය. ඇමැතිවරුද, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ද, සංස්ථාවල අධිකාරීන් ද ආදීන් බලා සිටින්නේ පිටරටකින් ණයක් ලබා ගැනීමටය. අද රටේ පිළිගත් පුද්ගලයන් වී ඇත්තේ පිටරටින් ණය ලබාගන්නවුන්ය. ණය ලබාගන්නේ මුදලින් පමණක් නොවෙයි. දැනුම ණයට ගන්නෝද රටේ ප්‍රබුද්ධයෝ වෙති. ඔවුහු විවිධ අර්ථවලින් රටේ ප්‍රබුද්ධයෝ වෙති. ඒ කෙසේ වෙතත් ජපන් තානාපතිගේ අණට කීකරු වීම හැර වෙනත් දෙයක් ආණ්ඩුවට ඉතිරි නොවීය. අද රනිල් ප්‍රභාකරන් ගිවිසුම සංශෝධනය කිරීමක් ගැන කතාවක් නැත. මෙරට තානාපතිවරුන් කෙතරම් බලසම්පන්න පුද්ගලයන් ද යන වග පසුගියදා කතානායක වි.ජ.මු. ලොකු බණ්ඩාර මහතා කර ඇතැයි සඳහන්වෙන ප්‍රකාශයකින් පැහැදිලි වෙයි. ඒ මහතා මේ ප්‍රකාශය කර ඇත්තේ රූපවාහිනී සාකච්ඡාවකදීය. එහිදී ඒ මහතා කියා ඇත්තේ ආණ්ඩුව වැඩිහිටියන්ට පමණක් වූ චිත්‍රපටිවලට යම් තහංචියක් පැනවීමට බලාපොරොත්තු වූ අවස්ථාවේදී මෙරට ඇමරිකන් තානාපතිවරයා මැදිහත් වී ඒ වළක්වා ලූ බවය. වැඩිහිටියන්ට පමණක් වූ චිත්‍රපටවලට යම් තහංචියක් පනවන්නේ නම් පී.එල්. 480 ගිවිසුම යටතේ ලබාදෙන පිටි ගැන නැවතත් සලකා බැලීමට සිදුවන බව ඇමරිකන් තානාපති පැවැසීය. පැහැදිලිවම මේ සිද්ධිය සිදුවන්නට ඇත්තේ එ.ජා.ප. ආණ්ඩු සමයකය. එවකට මෙරට සිටි ඇමරිකන් තානාපතිවරයා කවුදැයි අපි නොදන්නෙමු. ඔහු කවුරු වුවත් මේ සිද්ධිය අපට ඉතා වැදගත් වෙයි. එක් පැත්තකින් අපට ඇතැයි කියන නිදහස සම්බන්ධව මේ ප්‍රකාශය වැදගත් වෙයි. අනෙක් අතට සංස්කෘතිය යටත් විජිතවාදයෙහි දී කෙතරම් වැදගත් ද යන්න ද මෙයින් කියැවෙයි. මෙරට වැඩිහිටියන්ට පමණක් වූ චිත්‍රපට පෙන්වීම ඇමරිකාවේද අවශ්‍යතාවක් බව

© Prof. Nalin De Silva

මෙයින් පැහැදිලි වෙයි. අනෙක් පැත්තෙන් අප හාමතේ තැබීමට පියවර ගැනීමට ඇමරිකානුවන්ට ගතවන්නේ කෙතරම් සුළු කාලයක්ද යන්න ඉන් ප්‍රකාශ වෙයි. අද අපි උදේටත්, රාත්‍රියටත්, ඇමරිකන් පිටි, පාන් පිටි ආදී නම්වලින් හැඳින්වෙන තිරිඟු පිටිවලින් නිෂ්පාදිත ආහාර අනුභව කිරීමට පුරුදු වී සිටිමු. අපේ ආහාර සඳහා අප රටේ වගා නොකරන ධාන්‍යයක් මත යැපීමට සිදුවීම තරම් අභාග්‍යයක් තවත් නැත. මෙරට බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ ආරම්භකයන් වූ පෘතුගීසින් අපට හඳුන්වා දුන් පාන් සිට පාන් පිටි දක්වා ඒමට අපට ජේ.ආර්. ජයවර්ධනගේ, ලලිත් ඇතුලත්මුදලිගේ ආර්ථික ප්‍රතිපත්තිද ඉවහල් වී ඇති බව අමුතුවෙන් කිවයුතු නොවෙයි. ඇතුලත්මුදලි මහතා දත් ආර්ථික ප්‍රතිපත්තිය වූයේ මෙරට භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට යන වියදම පිටරටින් ඒ ආනයනය කිරීමට යන වියදමට වඩා වැඩි නම් අප ඒ භාණ්ඩය ආනයනය කළ යුතු බවය.

මෙහිදී අප භාවිතා කරන වචන පිළිබඳවද යමක් කිව යුතු වෙයි. තුන්මුල්ලේ විශ්වවිද්‍යාලයෙහි උගන්වන එක් දේශපාලන විද්‍යා මහාචාර්වරයෙක් පසුගිය සතිඅන්ත පත්තර කඩමාල්ලකට ලියමින් අප "ඉරිදා දිවයින" ට සතිපතා ලියන ලිපිය ගැන සඳහන් කර ඇත. මේ මහැදුරා ඇතුළු ඊනියා වාමාංශිකයන් යැයි කියා ගන්නා තුන්මුල්ලේ ඇදුරන්ට ඔවුන්ට අමතක වන කරුණක් ගැන මතක් කළ යුතුය. මා එකී විශ්වවිද්‍යාලයෙන් අස් කළ විට මට මා සාමාජිකත්වය දැරූ වෘත්තීය සමිතිය ඉදිරියට පැමිණ මට කීමට ඇති දේ දැන්වීමට මට තිබූ මූලික වෘත්තීය සමිති නිදහස පවා නැති කළේ මේ ඊනියා වාමාංශිකයන් ද ඇතුළු පී.එල්. පීරිස්ගේ වන්දිභට්ටයන් පිරිසක් බව අමතකවීමට ඉඩ දිය යුතු නො වෙයි. අද දෙමළ ජනයාගේ අයිතිවාසිකම් ගැන බෙරිහඬ දෙන මේ වාමාංශිකයන් එදා කටයුතු කළේ ඒ ආකාරයටය. එදා මේ ඊනියා වාමාංශිකයෝ අද විශ්වවිද්‍යාලයෙහි ප්‍රධානම පදවියක් දරන දක්ෂිණාංශිකයකු සමග පමණක් නොව අද ජනාධිපති උපදේශකයකු ලෙස කටයුතු කරන පුද්ගලයකු සමග ද එකතු වූහ. ප්‍රභාකරන් නම් ත්‍රස්තවාදියාගේ මානව අයිතිවාසිකම් අගය කරන මොවුහු මගේ වෘත්තීය සමිති අයිතිවාසිකම් නොදුන්හ. මේ සියල්ලෝම ඊනියා වාමාංශික දක්ෂිණාංශික භේදයකින් තොරව විජාතික බලවේගවල ඒජන්තයෝ පමණක් ම වෙති. මොවුන්ට ජාතික මතවාද ගැරඬියාට භූමිතෙල් මෙනි. ගැරඬින් වූ මොවුන් ගැන කතා කිරීමේදී නයාට අඳුකොළ වැනිය යන්න නැති වැදගත්කමක් ලබාදෙයි. අප ලෙනින්ගේ කසිකබල් අධිරාජ්‍යවාදය යන සංකල්පය යොදා නොගත්තද මේ මහැදුරා සිතන්නේ අප එසේ කරන බවයෟ අප යොදාගන්නා වචන නම් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය හා අදාළ යටත් විජිතවාදය යන්නයි. කිසිදාක බටහිර විද්‍යාව තේරුම් නොගෙන මාක්ස් විද්‍යාවක් ගැන හෝ මාක්ස්වාදයේ ඊනියා විද්‍යාත්මක බව ගැන හෝ කතා කරන මේ වාමාංශිකයෝ ලෙනින් මාක්ස්වාදයෙන් පිටපැන්න බව නොදනිති. ලෙනින්වාදය මාක්ස්වාදී නම් අයින්ස්ටයිනීය සාපේක්ෂතාවාදය නිව්ටෝනීයවාදී විය යුතුය. මේ මහැදුරාට අනුව බටහිරයන්ගේ තාලයට නැටීම අද යථාර්ථය වෙයි. යථාර්ථය යනුද නිර්මාණයක් බව ලකාන්වාදය ගැන යමක් දත්තවුන් දැනගත්තද මොවුහු ඒ බවවත් නොදනිති. කසිකබල් ලකාන්වාදීන්ට ද නොතේරෙන,එහෙත් සිංහල බෞද්ධයන් දන්නා දෙයක් නම් ඊනියා යථය ද ඇතුළු සියලු සංකල්ප නිර්මාණ බවය.

වැඩිහිටියන්ට පමණක් වූ චිත්‍රපට සම්බන්ධයෙන් යට කී අන්දමේ බලපෑමක් කළ ඇමරිකන් තානාපති ද අද ඊනියා සාම සාකච්ඡා සම්බන්ධයෙන් කරන බලපෑම් සිතාගත හැකිය. ආණ්ඩුව ඒ බලපෑම් ගැන ජනතාවට කිව යුතුය. එමෙන් ම මේ කසිකබල් සාකච්ඡා කෙළවර හමුදා ක්‍රියාමාර්ගයකින් කොටි පරාජය කිරීමට සිදුවන බවද ආණ්ඩුව තේරුම්ගත යුතුය. අද බටහිරයන් සිංහලයන්ට හා ආණ්ඩුවට කරුණු දෙකක් ගැන බිය ඇතිකර ඇත. ඒ ඊනියා ජාත්‍යන්තරයෙන් මොන පාවාදීමක් කර හෝ ණය ලබාගැනීම නතර කිරීමට ඇති බිය හා ඊනියා සාමය කඩකිරීමට ඇති බියය. මේ බියෙන් අප නිදහස් විය යුතුය. සාමය යනු බටහිර ක්‍රිස්තියානි රටවල අනුග්‍රහය ලබන කොටින්ගේ මනදොළ පිනවීමය. ඊනියා සාම සාකච්ඡා යනු සටන් කර දිනාගත නොහැකි ඊළම කොටින්ට ලබාදීමට කරන උපායක් පමණකි. බියෙන් නිදහස්වීමට අද වහාම කළ යුතු නිෂ්පාදන තුනක් වෙයි. අප වහාම ආහාර, ආයුධ හා දැනුම නිෂ්පාදනය කළ යුතු ය. එහිදී අපි බටහිරයන්ගෙන් ස්වාධීන විය යුතු වෙමු. අපි ඊනියා ලිබරල්වාදීන්ගේ, මාක්ස්වාදීන්ගේ පශ්චාත්නූතනවාදීන්ගේ, පශ්චාත් මාක්ස්වාදීන්ගේ හා එකී නොකී බටහිරයන්ගේ පා ලෙවකන දීනයන්ගේ ගැරහුම් මැද දැනුම නිෂ්පාදනය කරන්නෙමු.

ආණ්ඩුවට ඇත්තේ ආහාර හා ආයුධ නිෂ්පාදනය කිරීමය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva